# මේ බිහිසුණු ක්‍රමය සංත්‍රාසයෝ කැඳවති.

2001 සැප්තැම්බර් 11 ඇමෙරිකාවට කම්පනයකි. වානේ කඳු සහ කොන්ක්‍රීට් කුඩු පට්ටම් වී ඇද වැටුණි. අහිමි විය - ජීවිත සුණු විසුණු විය මොහොතකින්. නටබුන් කඳු අතර සිය ආදරණීයයන් වැළලී දැයි සොයන්නට විය.

සංත්‍රාසය පැමිණියේ අහසිනි.

දුඹුරු සමැති කතක්, අහිමි වූ ඇගේ ස්වාමියාගේ සේයාරුවද ගෙන රතු කුරුස සීමාවේ සිටගෙන සිටී. පරීක්ෂාවෙන් බලන්නේ නම් ඔහුට පිටුපසින් ඇගේ විමසිලිමත් දෙනෙත් පෙනේවි. නිල් නෙතැති තරුණයෙකු සැලෙන හදින් ඔහුගේ ප්‍රියයෙකු පිළිබඳ තොරතුරු බලා සිටී. අපේක්ෂාවෝ සිය සහෘදයින්, මිත්‍රයින්, සගයින් සමු ගත් යැයි යන සත්‍යයට හැරවුණි. පිළිගැටුම් මගින් දෛනික ජීවිතයේ සිට දෙව්ලොව තෙක් සාහසික ලෙස බලෙන් ප්‍රවිශ්ට වී ඒවා ඩැහැ ගෙන තිබේ.

ක්ෂණයකින් නිව්යෝර්ක් කගරය අපට බැග්ඩෑඩ්, බ්‍රෙල්ගේඩ්, සුඩානය, බටහිර ඉවුර, වියට්නාමය, පැනමාව, ඉන්දුනීසියාව, හිරෝෂිමාව, වියැක්වස් සිහි ගන්වයි.

අපේ මනසෙහි සේයා ඇඳී යයි. එක්සත් ජනපද බෝම්බ වැස්සක් මෙන් වැටෙන විට මව්වරු සිය දරුවන් සමග බැග්ඩෑඩයේ වීදි දිගේ දිව යති. එක්සත් ජනපද බෝම්බ මෙන්ම ජීවත් වන්ට අවශ්‍ය වන ජලය විෂ බවට හැරවීම නිසා ඉරාක කාන්තාවන්ට, සිය දරුවන් මැරෙන සැටි බලා සිටින්නට සිදු වේ. එක්සත් ජනපදයේ නිෂ්පාදිත, බටහිර ඉවුරේ පිපිරෙන රොකට් වෙඩි නිසා පවුල්වලට සිය දරුවන් මිනී පෙට්ටිවලින් රැගෙන යන්නට සිදුව තිබේ. සුඩානයේ ඖෂධ කම්හලක කම්කරුවෝ එක්සත් ජනපද කෲස් මිසයිලයකින් වීසි කර දමා ගිය ගල් කැබලි අතරින් භාණ්ඩ ලබා ගනිමින් සිටිති. බෙල්ග්‍රේඩයේ එක්සත් ජනපද ගුවන් බෝම්බ ප්‍රහාරයන්ගෙන් ගැලවී ගනු පිණිස මිනිස්සු බඩගාගෙන යති. බලන්න, චිලියේ ක්‍රීඩාංගන තුළ පෙර පෙම්වත් යුවල් සහ, දූ පුතුන් වොෂින්ටනය මෙහෙයවූ කුමන්ත්‍රණයක් නිසා සදහටම වැතිරී ඇත.

CIA ඒජන්තවරුන් සකසන ලද දේශපාලන ප්‍රතිවාදින්ගේ ලැයිස්තු අතැති, ඉන්දුනීසියන් හමුදාවේ ඝාතක කල්ලි නිසා සමහරෙක් භීතියෙන් යුතුව පණ අදියි. සිය සහසක් (ලක්ෂ ගණන්) ජන සංහාරවල මෘත සිරුරු මගින් ගංගා පුරවනු ලැබේ.

හිරෝෂිමාව, වියට්නාමය, බැග්ඩෑඩය; යුද්ධය නිවසටම පැමිණ ඇත. ඇමෙරිකන් අධිරාජ්‍යවාදයේ යුධමය සහ වෙළඳ සංකේතය වන ලෝක වෙළඳ මධ්‍යස්ථානය සහ පෙන්ටගනය මදිවට, ඊට ප්‍රතිඵලය ලෙස සත්‍ය ලෙසම සිදු වනුයේ බොහෝ අහිංසක මිනිසුන් ඝාතනය වීමයි.

මීට වග කියන්නේ කවරෙක්ද? ජනතාව එක්සත් ජනපදයේ හිංසනයට ඇද දැමුවේ කවරෙක්ද?

එක්සත් ජනපදයේ සැලසුම මැද පෙරදිගට ඇඟිලි ගැසීමයි. ඇමෙරිකන් භූමිය ගැන පමණක් වල් පල්ය - බොරු පිළිතුරුය. විශ්ව ව්‍යාප්ත නිර්දය ගෝලීය සුරාකෑම සහ යුධමය ක්‍රියාදාමයන් හරහා මේ අධිරාජ්‍යවාදීහු ලෝකයේ ජනතාවට නිමක් නැති නපුරු අපරාධ සහ සංහාරයෝ වැසි පතිත කිරීම නිසා - ලෝකය පුරා දශ ලක්ෂ ගණන් ජනතාව ඇමෙරිකන් රජයට වෛර කරන වාතාවරණයක් ඉදි කොට ඇත.

* * *

අපේ දෑස්වල දූවිලි පහවන විට, ඇමෙරිකන් බල යාන්ත්‍රණයේ සහ ලේ තැවරුණු යුධ යාන්ත්‍රණයේ ක්‍රියාවන්හි නියත ප්‍රතිඵලයන්ට ලෝකයේ බල සම්පන්න රාජ්‍යයන්ගේ ජනතාව වන අප ප්‍රාණ ඇප කරුවන් බවට පත්ව ඇත. දැන් යළිත් ඔවුහු ලෝකයේ ජනතාවට එරෙහිව සංත්‍රාසයන් පිළියෙල කරති - නිව්යෝර්ක් සහ වොෂිංටන් අතර ගලා හැලුණු කඳුලු මෙන් දහස් වතාවක් සංත්‍රාසයන් - මේ ශීත හදැති අධිරාජ්‍යවාදීහු සිය තිරිසන් භාවය තෘප්ත කරලීමට එවැනිම විනාශයක් ඉදිරියට කැඳවති.

දැන් ඔවුහු සිය ප්‍රති චලනයට සහය දෙන්නැයි ජනතාවට ආමන්ත්‍රණය කරති. ඔවුහු යුක්ති සහගත යුද්ධයක් ගැන දොඩවති. නැත, එය යුක්ති සහගත නොවේ.

මේ රාජ්‍යන්තර අධිපතීන්ට ඔවුන්ගේ යුධ ක්‍රියාවන් පවත්වා ගෙන යෑමට කිසිදු අයිතියක් නැත. ඒවා ලෝකය පුරාම වේදනාව පැතිරවීමේ මූලාශ්‍රයෝ වෙති. දැන් ඔවුන් ගමන් කරමින් සිටින යුද්ධය සහ යුධමය ක්‍රියාවන් - නම්

කරන ලද සහ නම් නොකරන ලද, රාජ්‍යයන් සහ ඉලක්කයන්ට - විරුද්ධත්වය දැක්විය යුතුය.

කම්පනය අතරින් අපි සත්‍යය සොයමු: ගෝලීය සූරා කන්නන්ට සහ ජන සංහාරකයින්ට ප්‍රතික්‍රියා දැක්වීමට කිසි අයිතියක් නැත. ඔවුන්ට හැක්කේ අයුක්තිය සහ විනාශය රැගෙන යාම පමණි. ඔවුන්ගේ බල ඇණි වලට සම්බන්ධ වන්නන්ට, ඔවුන්ගෙන් ආරක්ෂාව යදින්නන්ට, ධෛර්ය ඇති වනු ඇත්තේ මේ ග්‍රහ ලෝකයේ ජනතාවට ජනතාවට එරෙහිව ඉමහත් අපරාධ කිරීමට පමණි.


සම්පතයෙකු පිළිබඳ තොරතුරු අපේක්ෂාවෙන්, නිව් යෝර්ක් නගරය, සැප්තැම්බර් 13, 2001.

දේශභූමි තුළ ප්‍රීතිවන අරාබි තරුණයන්ගේ ඡායා රූ ඔවුන් අපට පෙන්වන්නේ, අපෙන් විමසන්නේ භයංකර පළිගැනීමක් පිළිබඳවයි. නමුත් අපිට විමසන්නට අවශ්‍යයි මැද පෙරදිග සහ ලෝකයේ අනෙක් කොටස් වල ජනතාව සැප්තැම්බර් 11 සිදුවීම සමරන්නේ ඇයි: අහිංසක ජීවිත නැති වූ නිසා නොවෙයි; නමුත් මිනී මරමින්, පුරසාරම් දොඩවමින් පවත්වාගෙන ගිය උද්දච්ච බලයේ අනභිභවනීයත්වය හෑල්ලුවට ලක් වූ නිසයි.


පලස්තීන දරුවන්, ඊශ්‍රායෙල සන්නද්ධ ප්‍රවාහන රථ, ගාසා තීරය, සැප්තැම්බර් 14, 2001

*    *    *

අධිපතීහු අපේ වේදනාවෙන් වාසි ලබා ගැනීමට, ඔවුන් සමග යාතිකා කරන්නැයි අපිට කියති. නමුත් ජනතාවට අපේ මරණයන් මතක් වන නිසා, බල යාන්ත්‍රණය සිදු කරන්නට තනන්නේ කුමක්ද? බොහෝ යුද්ධයන් සහ පොලිස් රාජ්‍ය පීඩනය නිදහස් කිරීමයි. ලෝක ජනතාව මංකොල්ල කෑමයි.

ඔවුහු ඝාතන ලැයිස්තු සකස් කරමින්, ආක්‍රමණ දියත් කරමින්, අති විශාල නව විදියේ ආඥාදායකයෙකු පිහිටවමින් ජනතාවගේ ආරක්ෂාව ගැන කතා කරති.


එක්සත් ජනපද බෝම්බ හෙලීමෙන් පසු ඉරාකයේ බැග්ඩෑඩ්, 1991.

යුද්ධය හරහා ත්‍රස්තවාදය හමාර කිරීමට කතා කරන ඔවුහු තීව්‍ර සංත්‍රාසයන් ජනිත කිරීමට සන්නද්ධ බල ඇණි සූදානම් කරති.

ඔවුන්ට අවශ්‍ය අප ඔවුන් සමග එක්සත් වනවා දකින්නට සහ අප, ඔවුන්ගේ ධජයේ රැල්ල වනවා දකින්නටය. කොහෙත්ම එය අවශ්‍ය නැත.

පවතින ආතතියෙන්, අපි ඉතිහාසයෙන් පාඩම් උගනිමු. ඔවුන් වෙනත් පර්ල් වරායක් ගැන කතා කරන විට, ඇමෙරිකන් රජය ඔවුන්ගේ ආරක්ෂාව උදෙසා, ජනතාවගේ භීතිය සමග සෙල්ලම් කරමින් ජපන් හා ඇමෙරිකන්වරු වට කිරීමට සහය පිණිස පෙළ ගැසෙමින් දේපළ මංකොල්ල කමින් කේන්ද්‍රික කඳවුරු තුළට ඇද දැමූ සැටි අපි සිහියට නගා ගනිමු. ඔවුන්ට එදිරිව ඔවුන්ගේ ප්‍රතිවාදීන්ට ආධාර උපකාර කළවුන්ව වර්ණ ගැන්වීමට තැත් දැරූ අයුරු අපේ සිහියට නැගේ.


නේටෝ (NATO) ගුවන් ප්‍රහාර, යුගොස්ලෝවියාව, 1999 මැයි.

මතක තබා ගන්න මේ රටේ අපරාධ වඩ වඩාත් ශක්තිමත් වෙයි; නැවත ඒවා සිදු නොවනු පිණිස, ඒවා වලක්වාලීමට අපි අධිෂ්ඨාන කර ගත යුතු වෙමු. අපිට ඔවුන්ගේ යුධ ක්‍රියාවන් සහ ඔවුන්ගේ ධජය පිටුපස සිට නිළ සහ නිළ නොවන ක්‍රමවේදයන්ගෙන් ඔවුන්ගේ අමානුෂික ක්‍රියාවන්ට දායක විය නොහැක. අරාබි ජනතාව තළා පෙළා බිම හෙලීමට සහ කෑත තර්ජන කිරීම සඳහා විෂ අදහස් කැවීමට කරන තර්ක විතර්ක අපට දක්නට ලැබේ.

සිය ආදරණීයයන් අහිමිවීමෙන් ශෝක වන ජනතාව වෙනුවෙන්, ලෝක ජනතාවට සත්‍ය ලෙසම යුක්තිය ළඟා කර දීමට අවශ්‍ය වන සියලු දෙනා සමග - සෑම ආකාරයකම යුද්ධයේ සහ පරිපීඩනයේ ක්‍රියාවන්ට එරෙහිව අපේ ප්‍රතිරෝධයේ ශක්තිය වැඩි කරලීමට, මේ ක්‍රමයෙන් ජනිත කරන අපරාධයන්ට එරෙහිව නැගී සිටීමට - අපි අත්වැල් බැඳ ගනිමු.

අපි අපේ ප්‍රතිරෝධය ගොඩ නගනවා මෙන්ම, නව යුද්ධයකට පිවිසෙන මෙම පීඩකයින්ගේ ස්වභාවය විනිවිද දැකීමට අපිට අවශ්‍යයි: මේ රටේ හෝ ලෝකයේ ජනතාවගේ ශුභ සිද්ධිය වෙනුවෙන් ක්‍රියා කිරීමට මේ බොරු ඇද බාන උද්ධච්චයෝ කටයුතු නොකරයි. එමෙන්ම මේ ක්‍රමය සිය බලය පවත්වා ගැනීමට අහසින් වැසි පතිත වන්නාක් මෙන් සංත්‍රාසයෝ ජනිත කරති.

සැප්තැම්බර් 14, 2001<br>
විප්ලවීය කොමියුනිස්ට පක්ෂය, එක්සත් ජනපදය<br>
Revolutionary Communist Party (RCP), USA

------------------------

මෙම ලිපිය විප්ලවීය ඇමෙරිකන් කොමියුනිස්ට් පක්ෂය විසින් 2001 සැප්තැම්බර් 11 ප්‍රහාරයයෙන් පසු, එක්සත් ජනපද අධිරාජ්‍යවාදීන් දියත් කරන්නට අපේක්ෂා කෙරුණු ආක්‍රමණ වලට එරෙහිව ජනතාව පෙළ ගැස්වීම සඳහා පළ කරන ලද්දකි.

නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම<br>
පරිවර්තනයකි<br>
T 16

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com